GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

16/08/2012

**මාධ්‍ය නිවේදනයයි.**

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ සාමාජික විශේෂඥ වෛද්‍ය ලලන්ත රණසිංහ මහතාගේ නිවසට අත් බෝම්බයකින් පහර දීම රජයේ වෛද්‍ය නිළධාරීන්ගේ සංගමය දැඩි ලෙස හෙලා දකී. තවද,

මින් ඉහත අවස්ථාවලදී ඇති වූ

- වෛද්‍ය එච්.එච්.ආර් සමරසේකර මහතාගේ නිවසට බෝම්බ ප්‍රහාරයක් එල්ල කිරීම.
- මහාචාර්ය පී.එස්.එස්. පණ්ඩිතරත්න මහතාගේ නිවසට වෙඩි තැබීම.
- වෛද්‍ය එන්.ජේ නෝනිස් මහතාට පහරදීම.

යනාදී සිද්ධීන් ඇතුළුව මෙම සිද්ධිය පෞද්ගලික වෛද්‍ය විද්‍යාල හා මතුවන කරුණු සම්බන්ධව ඍජුවම සබඳතාවයක් පවතින බවට සාධාරණ සැකයක් පවතී.

ශ්‍රී ලංකාවේ වෛද්‍ය සභාවේ ස්වාධීනත්වයට සහ එහි වෛද්‍යවරුන්ට ඇති කරන තර්ජනයන්ට විරෝධය පෑමක් ලෙස මෙම සිදුවීම පාදක කොටගෙන හෙට දින (17 සිකුරාදා) දවස පුරා දීප ව්‍යාප්ත සංකේත වැඩ වර්ජනයක් පැවැත්වීමට රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය තීරණය කොට ඇත. විශේෂඥ වෛද්‍ය ලලන්ත රණසිංහ මහතා සේවය කරනු ලබන කොළඹ ජාතික රෝහල අද දහවල් සිටම මෙම සංකේත වැඩ වර්ජනයට එළඹෙනු ඇත.

ස්තුතියි,

වෛද්‍ය නලින් ආරියරත්න
සහකාර ලේකම්

**වැඩි විස්තර සඳහා**

**වෛද්‍ය නලින් ආරියරත්න** : 0714800942
**වෛද්‍ය නවීන් සොයිසා** : 0718582444